

# උරුමය සොයා

# කමත් භාෂාව

අතීත රජ දවස සිට අප දිවයින අහරින් ස්වයංපෝෂිත වූ රටකි. කුඹුර නොඑසේනම් කෙත යනු ගොවිකමේ නිජ භූමියයි. ගොවියා වූ කලී ඒ නිජබිමේ අදිරාජ්‍යයාය. මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුස්සකු වේ යැයි එදා ගැමියා ප්‍රකාශ කළේ ඒ හෙයින් විය හැකිය. එදා ගොවියා කෙත්වතු අස්වද්දා නෙලාගත් අස්වැන්න මුලින්ම ගෙන ගියේ කමත වෙතටයි.

සිංහල ගොවියෝ අතීතයේ සිටම කමත නම් ස්ථානය පවිත්‍ර වූ භූමියක් ලෙස පිළිගත්තෝය. මේ හේතු නිසාම කමතට දැක්වූ පූජනීයත්වය පාදක කොටගෙන සුවිශේෂ වූ භාෂාවක් ද මෙරට බිහිවිය. එහෙත් වර්තමානය වන විට ඒ සුන්දර කමත් බස භාවිතයෙන් ඉවත්ව යමින් පවතී. එවන් වූ බසක අරුමය ගෙන එන හෙළිදව්වක දෙවන දිගහැරුමයි මේ.

- හරක් දක්කන විට නගන ඕසේ ඇදීම - අඬහැරපෑම
- ගොයම් හොඳින් මැඩවීම - අමුකටුවුනා
- පිදුරු කමතෙන් පිට කිරීම - මැඩුවන් බෑම
- පිදුරු - මැඩුවන්
- අම්බරුවන් (මී ගවයින්) කමතෙන් පිට කිරීම - පිටකමත් කිරීම
- වී - බැත
- වී එකතු කර ගොඩ කිරීම - බැත රැහි කිරීම
- ගොඩකළ බැත ගොඩ - රාහිකන්ද
- වේලෙන්නට දැමූ බැතය - බැත අතුර
- බැත හුලං කිරීමට හා පෙරීමට ගන්නා කුල්ල - යතුර, යතුර ගෙයියාව, පොලොන්නාව
- බැත හුළං කිරීම - බැත පෑහීම, බැත ගැරීම
- පස් කැට ඇහිලීම - කැටවැලි ඇහිලීම
- ගල් කැට - පරුවත කැට
- පාහින ලද බැත - බැත අරුව
- එපා කීම - ඉස්සරයි
- ටිකක් - බෝල්
- පුළුවන් කීම - සීරු
- බෑ කීම - අසීරු
- කමතේ වී මැනීම - යාල්ලීම
- බැත හුලං කර ඉතිරි කොටස - කාටුව
- බැත මැනීම කරන තැනැත්තා - යාල්ලන්නා
- බැත මනින උපකරණය - මනින්නාව
- බැත මැනීමේදී දෙවියන්ට වෙන්කරන පළමු පංගුව - අක්කියාල, දේවාල පංගුව
- කුකුළා - පිහාටු බරියා
- වේයන් මතුවීම - ලියන්නෝ මතුවෙනවා
- කමතේදී වී කෙටීම - මෝල් හං බෑම
- කමතට ගෙනා වංගෙඩිය - උහන්ගෙඩිය
- හාල් - පැහැයියා
- වී පොත්ත - දහයියා
- වැස්ස - ගඟුල බානවා, කෝඩබානවා
- අව්ව - දැඩියාව
- ගින්දර - රත්තා



- ☛ ගිනි මෙලවීම - රත්තා බෝ කිරීම
- ☛ කළගෙඩිය - කුඹල් ගෙඩිය
- ☛ කමතේ ඇති කුඩා මඩුව - පැල
- ☛ කමතේදී භාවිතා කරන සංගීත භාණ්ඩයක් - බුම්මැඩිය
- ☛ පොල් ගෙඩිය - මුත්තා
- ☛ කමතේ මංගල ගොයම් පිඩ තැබීමේ චාරිත්‍රය - උප්පිඩ තැබීම
- ☛ සුළඟ - බෝගා
- ☛ වී මනිනවා - යාල් දමනවා
- ☛ වහින්න එනවා - මන්දාරම
- ☛ වැඩ ඉක්මන් කිරීම - සේදිරි කිරීම
- ☛ ආහාරය - ඇඹුල
- ☛ කමතේ ඇති වතුර ඉවත් කිරීමට සකස් කළ ස්ථානය - කමත් මෝය
- ☛ වී කමත් භූමිය මත තැම්පත් වීම - බරුවන් පාත් වෙනවා
- ☛ අතට අල්ලා ගතහැකි ගොයම් ප්‍රමාණය - හීන් උප්පිඩ
- ☛ මැඩුවන් (පිදුරු), අයින් කරන උපරණය - දැති ගොයියා, උකුණු ගහ, උකුණු දැත්ත මැඩුවන් බැම

සටහන


*ඩී. ඩබ්. ජී. කේ. මාරපන,*
*කෘෂිකර්ම උපදේශිකා,*
*උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,*
*ගන්නෝරුව*




නත්ථි රාගසමෝ අග්ගි
නත්ථි දෝසසමෝ ගහෝ
නත්ථි මෝහසමං ජාලං
නත්ථි තණ්හා සමා නදී

කාමරාගයට සමාන ගින්නක් නැත.

ද්වේෂයට හා සමාන දැඩි අල්ලාගැනීමක් නැත.

මෝහය හා සමාන ජාලයක් (දැලක්) නැත.

තණ්හාව හා සමාන නදියක් (ගංගාවක්) නැත.

- ධම්ම පදය -